1st Place Winner
National Productivity
Award 2020

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/13/CIR.COM.(3) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.12. 31 |
|---|---|---|---|---|---|

ලේකම්,
ධීවර අමාත්‍යාංශය,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GSP/SP/1/1/01-II හා 2025.12.30 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛ ද්විත්වය 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා දකුණු පළාත් ආණ්ඩුකාර ධුරයේ වැඩ බලන සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2025.12.29 දින අනුමැතිය ලබා දී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | ශීර්ෂය |
|---|---|---|---|
| 01 | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025 | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අත් කාර්යාල වල නිලධාරීන්ගේ රාජකාරි වේලාවන් සංශෝධනය කිරීම. |
| 02 | | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2025 | රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම. |

03. ඒ අනුව උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ශෂී තාරුකා පී. මානවඩු
සහකාර ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත.

පිටපත :
01. පළාත් අධ්‍යක්ෂ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, දකුණු පළාත. - කරු. අ.ක.ස.

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number | GS/SP/1/1/01-II | ඔබේ අංකය / உமது இல. / Your Number | දිනය / திகதி / Date: 2025.12. 30 |

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම.**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක: CSS/03/13/CIR.COM (13) හා 2025.12.29 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් කෙටුම් පත් කරන ලද දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 හා චක්‍රලේඛ අංක 02/2025 සම්බන්ධව පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව පරිපාලන හා ආයතනික කටයුතු සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා පත් කරන ලද කමිටුව විසින් පහත දක්වා ඇති නිර්දේශ ලබා දී ඇත.

- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක **07/2024** හා **2024.07.10, 09/2024** හා **2024.09.20,09/2024(1)** හා **2025.01.01** චක්‍රලේඛ ආශ්‍රය කොට ගෙන දකුණු පළාත් සභාව සඳහා නව චක්‍රලේඛ ද්විත්වයක් කෙටුම්පත් කිරීමටත්,
- ඒ අනුව දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2025 හා 02/2025 අනුව සකස් කරන ලද නව චක්‍රලේඛ ද්විත්වය හි සඳහන් විධිවිධාන **2026.01.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ කර ගැනීම සඳහා, දකුණු පළාත් ආණ්ඩුකාර ධුරයේ වැඩ බලන සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2025.12.29 දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා එවමි.

03. එහි පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත ඉදිරිපත් කරමි.

**එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්,**
සහකාර ආණ්ඩුකාර ලේකම්,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත